# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල

**(නව නිර්දේශය)**

**පුරාතන සිංහල පද්‍ය හා සාහිත්‍ය විචාරය**

## SINH 38214

**පළමුවන කොටසේ පළමු ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

I කොටස

01. පහත දැක්වෙන පද්‍ය පාඨවල අර්ථ වර්තමාන ලිහිල් බසින් ලියන්න.

(අ)

ත හයි ත යත් යම් යෙවී පිය ත ළ ගල වී
තද වෙත ළ කරව ලී තද මයි බෙ(යදැ) කරවය

(මළ වි ද ඔයු)න් රත් අතින් ගත් බ(ව) මල්දම්
ඇ(තිවෙ)ය් දු ලයු තොප් ගල්කළ තද්ළ ඇත්තෙන් මුත්

බැලූමො රිසිසෙයි බෙයන්ද්හි මෙ හිරියැත්ත
දකුත් මෙ තොස් දි නැමි එ අතින් මල්දමක් ගත්තී

බෙයද්හි අද්හයි ආ දැන් සිත සෙ මෙ ගැහැනි
ලියක් ඇති මන ම නැයුළ(වී) ද ලබුයුක් ගත් (වී)

(ලකුණු 10)

(ආ)

අලළවා නෙත කැලුම් ලස ගමන් නිලුපුලන්
කලහස් දැනවූ මා තබා අසදහු ලූ නුගියෝ

නොලත ම දෙසැ හා විරති දිගැස දිගැසින්
නොවැ උනු දසුන් ඉස්නෙන් ඔවුනිඟි කෙසේ රැකියෙම්

පුරා නුරා ඇති පියවුරු දිදී ළෙහි මා
සැරහූ වන් පෙර දවස් හිදා නො තැවේ ද කෙසේ

රතොට රතැදියෙම් කොපොල් පතලේ බිදියෙම්
තනහස මුස කෙළෙම් නිදොසිම් ලූ හා නුගියට

(ලකුණු 10)

(අ.පි.බ.)

(ඇ) බා ති ය රජවන් පැරකුම් දින රද
ජෝති ය වත සියුරඟ සෙන් රැස් කඳ
ජෝති ය සිටු නරවර ගන'ඳර කඳ
බී ති ය කැරැ ගියෙ පරසක්වළ වැද

කි වී කැලන් ඔද යසසින් සුර රද
රි වී කුලෙන් පැවැතෙන පැරකුම් රද
ගැ වී සුරත සිරි පා සර මුවරද
නි වී තැවුල් සිතැ ඇපා හස රද

පි නි පා වන් පිරිසිදු යස වතුරු
සි ය පා තෙදයුත් මෙ රජුගෙ සොඳුරු
සි රි පා නිය රස් ගඟැ බැසැ මහරු
ස ත පා ගති ගිම් ගංපළ කුමරු

ර න් කො ඩි මෙන් වැඩි මුළු ලොව පසිඳු
පි න් දැ ඩි යෙන් වැඩි පැරකුම් නිරිඳු
ම න් එ ඩි යෙන් අඩි යක් පසු නො විදු
ක න් න ඩි ම න් මැඩි විකුමෙන් පුරුදු

(ලකුණු 10)

(ඉ) එසෙදෙහි එදෙව් පුත
ගුවන් සිඳු මැද ගමනොත
රන් නැව් යුතු එරත
රැගෙන බරණැස් පුරට යාගත

රන් දද නෙලෙන් සැඩ
කෙරෙමින් වලා කඩ කඩ
රැසින් ගනඳුරු මැඩ
අසා දිව එන රතෙහි සක් හඬ

එ පුර වැසි දන රැස
තමන් දොර දොර එළි බැස
වඩා කුහුල' ද හස
නරඹ නරඹා සිටිත පෙර දෙස

සිය රැළියෙන් සොඳුරු
විදුලිය වලන් තහවුරු
සඳ වෙල කුළු අයුරු
පෙනිණි ගන රන් රතය විසිතුරු

(ලකුණු 10)

## II කොටස

02. "සීගිරි ගී නිර්මාණාත්මක කාව්‍ය සමුච්චයකි." නිදර්ශනාශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

03. පොලොන්නරු යුගයේ ගී කාව්‍ය පිළිබඳ විමර්ශනයක් කරන්න.

04. කව්සිළුමිණ විශිෂ්ට මහා කාව්‍යයක් බවට පත්වන්නේ කවර හේතු පදනම් කොට ගෙන දැයි නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

(අ.පි.බ.)

05. "පැරකුම්බා සිරිත ප්‍රථම සිංහල ප්‍රශස්ති කාව්‍ය කෘතිය මෙන් ම ප්‍රශස්තතම ප්‍රශස්ති කාව්‍ය කෘතිය ද වේ." විමසන්න.

06. "ගුත්තිල කාව්‍යයෙහි සාර්ථකත්වය උදෙසා උපයුක්ත කාව්‍ය රීතියත් කාව්‍ය දෘෂ්ටියත් එක සේ බලපා ඇත." නිදර්ශනාශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

## III කොටස

07. "රසවාදය හා අලංකාරවාදය සියලු සංස්කෘත කාව්‍ය විචාරවාදවල පදනමයි." සාකච්ඡා කරන්න.

08. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳ ප්‍රමාණාත්මක සටහන් සපයන්න.

(i) ගුණ-රීති දෝෂ

(ii) ධ්වනිය හා ඖචිත්‍යය

(iii) වක්‍රොක්තිවාදය

09. සාන්දෘෂ්ටිකවාදී දර්ශනයෙන් (Existentialism) ආභාසය ලබමින් රචිත නවකතාවල නිරූපිත කතානායක භූමිකා පිළිබඳ සනිදර්ශන විග්‍රහයක් සපයන්න.

10. නූතනවාදී ඉංග්‍රීසි සාහිත්‍ය නිර්මාණවල ප්‍රභවයට හා විකාසනයට තුඩුදුන් සමාජ-දේශපාලන සන්දර්භය කෙබඳු දැයි විභාග කරන්න.

(02 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 15 බැගින්)

*****************************